චක්‍රලේඛ අංක :- 12/94

මගේ අංකය:- දපස/නීති/චක්‍ර
දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව,
අංක 07, බාලදක්ෂ මාවත,
ගාල්ල. 1994.04.27

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල
සභාපති වරුන් වෙත.

<u>සමූපකාර සේවකයින්ට පාරිතෝෂිත දීමනා ගෙවීම.</u>

ඉහත කරුණ සම්බන්ධව සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 128/84, 84.01.09, 131/84, 1984.08.25, 150/86, 86.06.25, 176/90, 90.06.27 දින දරණ චක්‍රලේඛණ කෙරෙහි ඔබගේ අවධානය මෙයින් යොමු කරවමි.

02. අදාළ චක්‍රලේඛණ වලින් දී ඇති උපදෙස් පරිදි පාරිතෝෂිත දීමනා ගෙවීම ගණන් බලන ආකාරය වෙනස් කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත. 1994. ජනවාරි මස 01 වන දිනෙන් පසු සමිතියෙන් විශ්‍රාම යන/වර්ෂ 5 ක සේවා කාලයකින් පසු ඉල්ලා අස්වන සේවකයින්ට පහත සඳහන් ආකාරයට පාරිතෝෂිත දීමනා ගෙවීම් කල යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

I. මාසික වැටුප් ලබන සේවකයින්ට වර්ෂ 5 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු සේවයෙන් ඉල්ලා අස්වන හෝ විශ්‍රාම යන අවස්ථාවේදී, එම සේවකයා සේවයෙහි යෙදී සිටි අවසාන මාසයේදී ලබා ගත් වැටුපෙන් හරි අඩක් (1/2) සැලකිල්ලට ගෙන සේවය කළවර්ෂ ගණනින් ගුණ කිරීමෙන් තීරණය කරනු ලබන මුදලට සමාන මුදලක් පාරිතෝෂිත වශයෙන් ගෙවිය යුතුය.

II. කැලි මට්ටමේ සේවකයින්ට පාරිතෝෂිත දීමනා ගෙවීමේදී ඔවුන් සේවය කළ එක් එක් වර්ෂයක් සඳහා දින 14 ක වැටුපට සමාන මුදලක් බැගින් ගෙවිය යුතුය. එමම දින 14 ක වැටුප ගණනය කිරීමේදී සේවකයා පූර්වා සන්න මාස 12 තුල වැඩ කළ දින ගණන්, ගෙවා ඇති වැටුප් මුදල් ප්‍රමාණයත් ගණනය කර, එම මුදල් වැඩ කරන ලද දින ගණනින් බෙදීමෙන් එක් දිනක වැටුප් තීරණය කර ඒ අනුව වර්ෂයකට ගෙවිය යුතු දින 14 ක වැටුප ගණන් බැලිය යුතුවේ.

(සුමතිපාල වාහලවත්ත)
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත්:- 1. ආහාර හා සමූපකාර අමාත්‍යාංශයේ ලේකම් - (දකුණු පළාත)
2. ස.සං.කො/රෙ ( දකුණු පළාත)
3. දකුණු පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.
4. ද.ප.ස./චක්‍ර/ගොනුවට.

දේ/20.